# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1702/6 – 2011 අප්‍රේල් 20 වැනි බදාදා – 2011.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: උදු/2/2/10/30.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: L/03J/95/FR/162.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිගංකුඹුර ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි මීතොටවත්ත නම් වූ සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 369 අතිරේක අංකය 9 පත්‍ර අංකය 9 දරන මූලික පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 14.0904ක් වූ ඉඩම් කැබලි අංක 543 සහ හෙක්ටයාර් 10.5749ක් වන කැබලි අංක 544 වන ඉඩමත් සමග මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 24.6653ක් වන ඉඩම.

හිමිකම් කියන අය: ඊ. ආර්. එන්. එම්. ජී. ඩබ්. සෙනෙවිරත්න බණ්ඩා, මාළිගා වලව්ව, උඩදුම්බර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 මැයි මස 25 වැනි දින පූ. භා. 10.30 ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2011 මැයි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2011 ජනවාරි මස 05 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 58

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ල/ප්‍රාලේ/3/3/5/2/20.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 13/99/එෆ්ආර්/383.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මෙහි මහජන කටයුත්තක් යනු නකල්ස් සංරක්ෂණ කලාපයට ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලග්ගල උඩසිය පත්තුවේ පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි ලග්ගල වතුයාය ඉඩමේ සර්වේයර්

ජනරාල් විසින් 2010.11.20 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු මා. 1536හි කැබලි අංකය 1, මුළු වර්ගඵලය හෙක්ටයාර් 36.6404.

ඉඩමේ නම: ලග්ගල වතුයාය; විස්තරය: පතන; හිමිකම් කියන අය: ශබියාර් මොහොමඩ් සන්ගනී, අංක 216, ලේක්ඩ්‍රයිව්, කොළඹ 08.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 මැයි මස 26 වැනි දින පූ. භා. 10.00 ට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2011 මැයි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. ඒ. සරත්චන්ද්‍ර,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල - පල්ලේගම.

2010 දෙසැම්බර් මස 31 වැනි දින,
ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.